දුරකථන
தொலைபேசி
Telephone
2369800
2369297
2368539

මගේ අංකය :
எனது இல:
My No: **WCA/02/01/N.A./2020**

**කම්කරු දෙපාර්තමේන්තුව**
කාන්තා ළමා කටයුතු අංශය
**DEPARTMENT OF LABOUR**
Women's and Children's Affairs Division
தொழில் திணைக்களம் பெண்கள், சிறுவர் விவகாரப் பிரிவு

ෆැක්ස්
பெக்ஸ்
Fax 2369297

ඔබේ අංකය
உமது இல
Your No.

**මෙහෙවර පියස , කොළඹ 05, ශ්‍රී ලංකාව.**
மெகவர பியச, கொழும்பு 05, இலங்கை
Mehewara Piyasa, Colombo 5, Sri Lanka

2020.11.04

කාර්මික ව්‍යාපාරයන්හි සේවායෝජකයන් වෙත,

<u>**රාත්‍රී සේවා අනුමැති කාලය දීර්ඝ කිරීම.**</u>

කාර්මික ව්‍යාපාරයන්හි සේවයේ යොදවා ඇති කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා ඔබ විසින් ලබා ගෙන ඇති කම්කරු කොමසාරිස් ජනරාල්ගේ පූර්ව අනුමැතිය 2020.09.01 දින සිට 2020.12.31 දින දක්වා කාලය තුළදී කල් ඉකුත් වන්නේ නම්, එම අනුමැතිය 2020.12.31 දින දක්වා දීර්ඝ කිරීම සඳහා කම්කරු කොමසාරිස් ජනරාල් විසින් විශේෂ අවසරය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

02. දිවයින තුල දැනට පවතින කොවිඩ් - 19 වසංගත තත්ත්වය සලකා බලා මෙම පරිපාලනමය තීරණය ගෙන ඇති බවත්, මෙම දීර්ඝ කිරීම අදාල වන්නේ මේ වන විට අනුමැතිය ලබා ඇති ආයතන සඳහා පමණක්ම බවත් අවධාරණය කරමි. මෙම කාලය තුළදී ඔබ විසින් කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා වන කොන්දේසි උල්ලංඝනය කිරීමක් අනාවරණය වුවහොත් මෙම අනුමැතිය අවලංගු කිරීමට කටයුතු කරන බවද වැඩිදුරටත් දන්වමි.

03. ඒ අනුව, 2020.12.31 දින සිට වලංගු වන පරිදි රාත්‍රී සේවා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් හෝ ඔබ ව්‍යාපාරය සඳහා කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා නව අනුමැතියක් අවශ්‍ය වන්නේ නම් පමණක් මාර්ගගත ක්‍රමය යටතේ ඉල්ලීම ඉදිරිපත් කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

මාධවී. එන්. ගුණවර්ධන
කම්කරු කොමසාරිස්
කාන්තා හා ළමා කටයුතු අංශය

පිටපත් : සියලුම කලාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස් වරුන් සහ සහකාර දිස්ත්‍රික් කම්කරු කොමසාරිස් වරුන් - අ.ක.ස.